# විවිධ

# සම්ප්‍රදාය හා අපේ දරුවන්

"මට මතකයි මට මතකයි
පුංචි බබෙක් මං
මව් උකුලේ දිනෙක ඉඳන්
නැළවුණොම මං

මට මතකයි මට මතකයි
සීයා අපේ තුම්
මිදුල පුරා කෝටුවකින්
ගෝනකු ඇඳ දුන්"

ශ්‍රී ලාංකික ගැමි පරිසරය තුළ එදා දරුවන් ගෙවූ සුන්දර ජීවිතය පිළිබඳව සිතන විට සිහියට නැගෙන මෙවන් ළමා කවි අපගේ බාල වියේ මිහිරි මතකයන් තුළ අදටත් නොමැකෙන සටහන් තබා ඇත. ඒ සොඳුරු අතීතය එලෙසින්ම ගෙවන්නට වත්මන් බාල දරුවන්ට ඉඩකඩ නොලැබී ගොස් ඇති බව පැහැදිලි කරුණකි. කරුණු එසේ වුවද, විදේශයන්හි දිවි ගෙවන ශ්‍රී ලාංකික දරුවන් තම දෙමාපියන් හෝ මිත්තණියන් විසින් මෙබඳු කවි, සින්දු ගායනා කරන විටදී ඒ දෙසට ඔවුන්ගේ අවධානය නිතැතින්ම යොමු වන්නේ ද පරම්පරාගතව එන සමීප බවක් නිසාම විය හැකිය.

"ටිවින්කල් ටිවින්කල් ලිටිල් ස්ටා
හව් අයි වන්ඩර් වට් යූ ආ
අප් එබව් ද වර්ල්ඩ් සෝ හයි
ලයික් අ ඩයමන්ඩ් ඉන් ද ස්කයි"

මෙවැනි ඉංග්‍රීසි ළමා ගීයක් ගයන්නට හොඳට හුරු පුරුදුව සිටින එබඳු දරුවකුට,

"රන්වන් පාටයි සමනලයා
රෝස මලේ පැණි බීල ගියා
ආයෙත් ඒවිද ඒ සමනලයා
මල්වල පැණි බොන්ටා"
නම් වූ සුන්දර ගීතයක් ඇසෙන විට සැණෙකින් සිය අවධානය ඒ දෙසට යොමු වන්නේ ද ඉතින සඳහන් කළ නැඹුරුව නිසාම විය යුතුය.

සංස්කෘතිය වූ කලී පරපුරෙන් පරපුරට ඉදිරියට ගෙන යනු ලබන, වැඩිහිටියන් විසින් සිය බාල දරුවනට පවරා දෙනු ලබන මහඟු දායාදයකි. කවර පුද්ගලයකු හෝ වේවා තමන් බාල වියේදී ඇසූ දුටු දේ, රස විඳි දේ, සිත් ගත් දේ මුළු ජීවිත කාලය පුරාම තමන්ගේ චිත්ත අභ්‍යන්තරයෙහි නොදැනුවත්වම වාගේ රඳවා තබා ගැනෙන දේ බවට පත් වෙයි. කුඩා කල තමන් රස විඳ ආහාර පාන වර්ග ඒ ආකාරයෙන්ම යළි රස විඳ ගන්නට කවර පුද්ගලයකු තුළ හෝ ආශාව ඇති කරයි. බාල වියේදී තමන් හැදුණ වැඩුණ පරිසරයට මනසින් හෝ පිවිස එහි තතු- නරඹා තාවකාලිකව හෝ සුන්දරත්වයක් විඳ ගැනීමට කවුරු වුවත් කැමැත්තක් දක්වනු ඇත. දරුවකු කුඩා කල මව් උකුලේ නැළවෙද්දී අසුණ නැළවිලි ගී හඬ ජීවිතය පුරාම තම හදවතට සමීපව දැනෙන බවට සැකයක් නැත. විදේශයක ඉපිද හැදෙමින් වැඩෙමින් සිටින කුඩා දරුවකුට සිය මිත්තණියගේ මුවින් නැගෙන,

"බාලොලි ලොලි ලොලි . බාලොලි ලොලියේ
බාලොලි රන් පුත . නිදියාගන්නේ"
යන විශාරද නන්දා මාලනී ගැයූ ගීතය කොතරම් මිහිරි බවක් ගෙන එනු ඇද්ද? දරුවන් ටිකෙන් ටික වයසින් වැඩෙද්දී වුවද ඒ සුමිහිරි තනුව ශ්‍රවණය වෙත්ම සුන්දර සිතුවිලිවලින් ඔවුන්ගේ හදවත් පිරි යනු අපි දැක ඇත්තෙමු.

විදේශීය පරිසරයක දිවි ගෙවන ශ්‍රී ලාංකික දරුවන්ට සිය මුල් රටෙහි සංස්කෘතිය පිළිබඳව පෞද්ගල වශයෙන් අත්දැකීම් ලබන්නට ඇති අවකාශ මඳ වුවද, කවර විටක හෝ එවැනි දේ අත්විඳගන්නට ලැබීමෙන් ඔවුන්ගේ මෙන්ම ඔවුන් රැක බලාගන්නා වැඩිහිටියන්ගේ ද සිතට දැනෙන සතුට කියා නිම කළ නොහැකි තරමිය. පසුගිය දා ශ්‍රී ලංකාවාසීන් අලුත් අවුරුදු සැමරීමෙහි යෙදී සිටි අයුරු විවිධ මාධ්‍ය මගින් වුව විදේශයන්හි සිටින ලාංකික ජනතාවට දැක බලාගත හැකි විය. අලුත් අවුරුද්ද උදා වන්නට පෙර සිටම මේ පිළිබඳ පෙර සිහිකිරීම් සමග විවිධාකාරයේ දැනුම ලබා දීම ද සිදු විය. ශ්‍රී ලංකාව තුළ ජීවත් වන දෙමාපියදරු සියලු දෙනාම මේ සඳහා ලක ලෑස්ති වූ අතර විදෙස්වල වසන ශ්‍රී ලාංකික පිරිස ද සුළු වශයෙන් හෝ සූදානමක් ඇතිව සිටි බව ද

සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

දැකගන්නට ලැබිණ.

කිසියම් සමාජයකට ආවේණික වූ සංස්කෘතියක අන්තර්ගත සාරධර්ම මෙන්ම ඊට අදාළ විවිධ චාරිත්‍ර චාරිත්‍ර ද රාශියක් වෙයි. විශේෂයෙන්ම සිංහල ජනතාව විසින් සමරනු ලබන අලුත් අවුරුදු චාරිත්‍ර අතර එදා සිට අද දක්වා පැවතෙන සිරිත් බොහොමයක් සමාජයට හිතකර වූත් වැඩදායක වූත් ඒවා බවට සැක නැත. කවර රටක හෝ සමාජයක කාලයක් තිස්සේ පැවතෙන යමක් තවදුරටත් එහි ජනතාවගේ අවධානය දිනාගනු ලබන්නේ ඒවායේ වැදගත්කම හා අවශ්‍යතාව නිසාය. කවර හෝ සංස්කෘතියකට අලුතෙන් එක් වන යම් අංගයක කල්පැවැත්ම සිදු වන්නේ ද එහි අවශ්‍යතාව මතය. අලුත් අවුරුදු චාරිත්‍ර අතර එදා සිට අද දක්වා අගය කෙරෙන හා පිළිපදිනු ලබන බොහෝ අංග සමාජයෙහි මුල් බැසගෙන තිබෙන්නේ ද ඒවායේ ඇති එකී වැදගත්කමත් අවශ්‍යතාවත් මතය.

මෙවන් සම්ප්‍රදායයන් වැඩිහිටි පරපුරට සතැට මෙන්ම අර්ථවත් බවක් ද ගෙන එන අතර, නවීන ලෝකයක ඉදිරියට යමින් සිටින අපේ දරු පරපුරට මේවා අදාළ වන්නේ කෙසේද යන්න ගැන පසුගිය කාල සීමාව තුළ ශ්‍රී ලංකාවාසී අපි විමර්ශනයෙහි යෙදී සිටියෙමු. සිංහල අවුරුදු චාරිත්‍ර අතර මූලික අංග කීපයක් වෙයි. නව සඳ බැලීම, පරණ අවුරුද්දේ වැඩ අවසන් කිරීම, නොනගතය හෙවත් පුණ්‍ය කාලය, අලුත් අවුරුදු උදාවේදී සුබ නැකතින් ලිප් බැඳ ගිහි මොළවා කිරිබත් පිසීම, නියමිත නැකැත් වෙලාවට අනුව ආහාර අනුභවය, ගනුදෙනු කිරීම හා වැඩ ඇරඹීම, ඉන් පසු දිනකට යෙදෙන සුබ මොහොතින් හිස තෙල් ගා ස්නානය කිරීම, අවසන් වශයෙන් රැකී රක්ෂා සඳහා පිටත්ව යාම යන මෙම ප්‍රධාන අවස්ථා කීපය රටවාසී සියලු සිංහල ජනතාව අදටත් ඉමහත් උද්යෝගයකින් යුතුව සිදු කරන බව කිව යුතුය. එදා කෘෂිකාර්මික සමාජය තුළ නොපැවැති අන්දමට වර්තමානයේ ජනතාව විවිධ රැකියාවල නිරතව සිටිති. විශේෂයෙන්ම සිය ගැමි පරිසරයෙන් දුර ඈත පිහිටි කාර්යාලවල සේවය කරන්නෝ බොහෝ දෙනෙක් මේ අතර වෙති. ඔවුන්ට සිත් සේ අවුරුදු චාරිත්‍රවල නියැලෙන්නට රජය මගින් සලසා දෙනු ලබන අවකාශය වැදගත් දෙයකි. අලුත් අවුරුද්ද වෙනුවෙන් අවම වශයෙන් දින තුන හතරක් වත් නිවාඩුවක් රජය මගින් ඔවුන් වෙත ලබා දෙනුයේ ගම්රටවල් බලා ගොස් සිය දෙමාපිය නෑ හිතවතුන් සමග අලුත් අවුරුදු සමරන්නට ඉඩ සලසා දෙමිනි.

මෙනයින් බලන කල සිංහල සංස්කෘතිය තුළ අද වන විට බොහෝ දෑ වෙනස් වී තිබුණත්, ඒ අතර නොවෙනස්ව පවතින අලුත් අවුරුදු සිරිත් විරිත් ඉටු කිරීමෙහි ලා සමස්ත සමාජයම උද්යෝගයක් දක්වන බව කිව යුතුය. මෙබඳු සිරිත් විරිත්, ඉහත දැක්වූ පරිදි, බාල වියේ සිට පුරුදු පුහුණු කරගත් වැඩිහිටි අපට අත්‍යවශ්‍ය වූ කාර්ය භාරයකි. එසේම අප ඒ සියලු චාරිත්‍ර චාරිත්‍රවල යෙදෙන්නේ ද අපේකම පිළිබඳ භක්තියාදරයකින් ද යුතුවය. "මට මතකයි මට මතකයි පුංචි බබෙක් මං ... " යන ළමා ගීයෙන් කියවුණ පරිදි අද වැඩිහිටියන් බවට පත් වී ඇති අපි, අපේ ළමා වියට මනසින් ආපසු යමින්ම, එම චිත්‍ර වූ සිරිත් විරිත් ඉටු කළ ආකාරයට යම්තරමක් හෝ සමීපව අදත් ඒවා ඉටු කරන්නට යොමු වෙමු.

කරුණු එසේ වුවද, වාණිජත්වයට නැඹුරු වෙමින්, නව තාක්ෂණයට හුරු වෙමින්, පරිගණකය තම සමීපයේම තබාගෙන, අන්තර් ජාලයට පිවිසෙමින්, විවිධ වූ වෙබ් අඩවිවල සැරිසරමින් අලුත් දැනුමක් ලබන අපේ දරුවනට මේ සිරිත් විරිත් කෙසේ නම් අදාළ වන්නේද යන ප්‍රශ්නය නැගීමට කවරකුට වුව ඉඩකඩ ඇත. සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට සංක්‍රමණය වන කාල සීමාව ගැන සිතන්නට, අදහන්නට අපේ දරුවන්ට අපහසු නොවුවද එම සංක්‍රාන්ති සමය තුළ ලිප ගිහි මෙළවීම, ආහාර අනුභවය, ගනුදෙනු හෝ වෙනත් සුබ කටයුතු තහනම් ඇයි ද යන්නට ඔවුන්ගේ දැනුමට සරිලන සේ පිළිතුරු දීමට වැඩිහිටි අප අසමත් වන අවස්ථා නැත්තේ නොවේ.

එසේ නම් මෙම අන්ත දෙක ගළපාගනිමින් අපේ දරුවනට කරුණු අවබෝධ කොට දිය හැක්කේ කෙසේද යන ගැටලු සහගත තත්වයකට වර්තමානයේ වැඩිහිටියන්ට මුහුණ දීමට සිදු වන්නට ඉඩ ඇත. කුඩා දරුවන් බාල වියේදී,

"රන් පිගාන ලෙස වටකුරු
දිළිහි දිළිහි තිබෙන අපූරු
හඳහාමියෝ! හඳහාමියෝ!
කිරින් පැණින් දියෝ! දියෝ!"

යනාදී වශයෙන් ආනන්ද රාජකරුණා වැනි කවියන් ලියූ සඳ ගැන කියවෙන කවි කීවේ එහි ගැඹුරු අරුතක් විමසන්නට යොමු නොවෙමිනි. හඳහාමි රන් තැටියක දමා කිරිපැණි ගෙන එන අයුරු මෙන්ම,
"සිහිල් වෙතියි සඳ ඉතා . හාවා එහි පැන ගනා රැසින් අඬක් නොනවතා . සිරිඳ ඒ හොඳ සතා"
යනුවෙන් කුමාරතුංග මුනිදාස මහතා කවි ලියූ අයුරින් හඳෙහි සිටින හාවා ගැනත් දරුවන් සිතා බැලුවේ ඔවුන්ගේ සුන්දර මනෝ ලෝකය තුළට පිවිසෙමිනි. මේ ද, යථාර්ථය හා කල්පිතයේ මුසු වීමකි. දරුවන් සිය බාල විය ගෙවමින් ජීවත් වන මනඃකල්පිත ලෝකය තුළ ද ස්වාභාවයෙන් සිදු වන දේට වඩා වෙනස් දේ සිදු වන අයුරු ඔවුන් දැක ඇත. කුමාරතුංග මහතා දරුවන් වෙනුවෙන් ලියා තැබූ 'හීන් සැරය' ළමා කතා පොතෙහිදී විවිධ වර්ගයේ වන සත්තු විවිධාකාර හපන්කම්වල යෙදී සිටිති. කතුවරුන් දරුවන් උදෙසා නිර්මාණය කළ